# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2115/11 - 2019 මාර්තු මස 18 වැනි සඳුදා - 2019.03.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර*:

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිතුල්ගල පළාත සුළු කොට්ඨාසයේ අංක 134බී කිතුල්ගල දකුණ නිලධාරී කොට්ඨාසයේ පරවලතැන්න ගම පිහිටි මැනුම්පති විසින් පිළියෙළ කරන ලද අංක අ.ග.පි. 783 අති 13 හා 2018.12.29 දරන අවසාන ගම් පිඹුරේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.2343 ක් වන පහත සඳහන් ඒ සිට ඩී ලෙස දක්වා ඇති ඉඩම් කොටස්වලට මායිම් වලින් යුත් ඉඩම.

**01. කැබලි අක්ෂර ඒ – අහස්ලෙන වත්ත, ප්‍රමාණය: හෙක්. 0.5385.**

*උතුරට* : කැලණි ගඟ; *නැගෙනහිරට* : අහස්ලෙන වත්ත; *දකුණට* : කැබලි අක්ෂර බී (මාර්ගය); *බටහිරට*: අහස්ලෙන වත්ත.

**02. කැබලි අක්ෂර බී – අහස්ලෙන වත්ත, ප්‍රමාණය: හෙක්. 0.0387.**

*උතුරට*: කැබලි අක්ෂර ඒ සහ අහස්ලෙන වත්ත; *නැගෙනහිරට*: මාර්ගය සහ අහස්ලෙන වත්ත; *දකුණට*: කැබලි අක්ෂර ඩී (මාර්ගය) සහ කැබලි අක්ෂර සී; *බටහිරට*: අහස්ලෙන වත්ත සහ මාර්ගය.

**03. කැබලි අක්ෂර සී – අහස්ලෙන වත්ත, ප්‍රමාණය: හෙක්. 0.6263.**

*උතුරට*: කැබලි අක්ෂර බී (මාර්ගය); *නැගෙනහිරට*: කැබලි අක්ෂර ඩී (මාර්ගය); *දකුණට*: අහස්ලෙන වත්ත; *බටහිරට*: අහස්ලෙන වත්ත.

**04. කැබලි අක්ෂර ඩී – අහස්ලෙන වත්ත, ප්‍රමාණය: හෙක්. 0.0413.**

*උතුරට*: කැබලි අක්ෂර බී (මාර්ගය) සහ අහස්ලෙන වත්ත; *නැගෙනහිරට*: අහස්ලෙන වත්ත; *දකුණට*: මාර්ගය, අහස්ලෙන වත්ත. සහ කැබලි අක්ෂර සී; *බටහිරට*: කැබලි අක්ෂර සී.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ඉහත සඳහන් ඉඩමට / පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.04.01 වැනි දින පෙරවරු 10.30 ට යටියන්තොට ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2019.03.25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ආර්. කේ. සමන් අනුර,
ප්‍රාදේශීය ලේකම්,
යටියන්තොට.

යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04-21

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.